ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : PCMD/AD/2/1/1/26

2012 අප්‍රේල් මස 9 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත

**<u>සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාවේ අනාගත අපේක්ෂාවන් සපුරාලනු පිණිස රාජ්‍ය සේවය ප්‍රතිනිර්මාණය කිරීම සහ ප්‍රශස්ත ලෙස රාජ්‍ය වියදම් කළමනාකරණය, වගවීම, නාස්තිය හා දූෂණය පිටුදැකීම</u>**

අතිගරු ජනාධිපතිතුමා විසින් 2012.04.02 දින අරලියගහ මන්දිරයේ දී රාජ්‍ය නිලධාරීන් අමතා කළ දේශනය ආශ්‍රිතව සිදු කරනු ලබන පහත සඳහන් උපදෙස්/නියෝග කෙරෙහි ඔබගේ ක්ෂණික අවධානය යොමු කරවමි.

(අ) සමස්ත රාජ්‍ය අදායමින් 46% ක පමණ ප්‍රතිශතයක් දරමින් පවත්වාගෙන යන මෙරට රාජ්‍ය සේවය මහජන අභිලාශයන් ඒ අයුරින්ම සපුරාලන්නේ ද යන්න පිළිබඳ ව එක් එක් විෂය පථයට අයත් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරණ සෑම අමාත්‍යාංශ ලේකම්වරයෙකුම, දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුම, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානියෙකුම ගැඹුරින් විශ්ලේෂණය කිරීමේ ක්ෂණික හා කාලීන වැදගත්කම පිළිබඳ ව ඔබගේ පෞද්ගලික අවධානය අපේක්ෂා කරමි.

(ආ) රාජ්‍ය වියදම් කළමනාකරණයේ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා වූ විගණන ක්‍රියාවලිය පිළිබඳ ව එක් එක් අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මෙන් ම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් පුද්ගලිකව වගවීම සහතික වනු පිණිස ක්ෂණික හා කාලීන පියවර වහාම ගැනීම. (මින් ඉදිරියේදී සෑම විගණන විමසුමක් සඳහා ම ආයතන ප්‍රධානියා විසින් ඉදිරිපත් කරන පැහැදිලි කිරීම් පිළිබඳ ව පෞද්ගලිකව ම වගවන බවට ප්‍රකාශයක්ද අත්සන් කළ යුතුව ඇත.)

(ඇ) රාජ්‍ය තන්ත්‍රය ක්‍රියාත්මක වීමේදී දෛනිකව සිදුවන, සුළු පරිමාණ වුව ද එකතු වූ විට ඉතා විශාල ප්‍රමාණයක් වන නාස්තිකාර වියදම් වහාම නවතාලීම සහතික වනු පිණිස සෑම රාජ්‍ය ආයතනයක්ම, 2012 ජනවාරි මාසය පාදක මාසය කොට ගත් වියදම් කළමනාකරණ වැඩසටහනක් සකස් කොට, එක් එක් අමාත්‍යාංශ ලේකම්ගේ/ආයතන ප්‍රධානියාගේ ප්‍රධානත්වයෙන් සෑම මාසයක් අවසානයේ දී සමාලෝචනයට ලක් කර, එම වාර්තාවේ පිටපතක් ජනාධිපති කාර්යාලය වෙත හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත 2012 මාර්තු මස 30 වන දිනයෙන් ආරම්භව අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානීන්/සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානිගේ අත්සනින් යුතුව යොමු කිරීම.

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපෑල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

(ඇ) දිවයින තුළ භාෂාත්‍රයෙන් දෛනිකව පළවන සියලු පුවත්පත්, දිනයේ පෙරවරුවේම පරිශීලනය කර අදාළ ප්‍රවෘත්ති/වාර්තා මගින් තම අමාත්‍යාංශයට/දෙපාර්තමේන්තුවට/ සංස්ථාවට/ව්‍යවස්ථාපිත මණ්ඩලයට අදාළව නිවැරදි නොවන දත්ත/ ප්‍රකාශ පළ කර තිබේ නම්, නියමිත නිවැරදි කිරීම් සකස් කර අදාළ පුවත්පත් කාර්යාල වෙත දිනය තුළදීම ෆැක්ස් හා ඊමේල් මගින් යොමු කර දුරකථන මගින් ද සනාථ කර දින දෙකක් ඇතුළත නිවැරදි කිරීම් පළකරවා ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කොට, එහි පිටපත් විද්‍යුත් තැපැල් මගින් ජනාධිපති කාර්යාල නිල විද්‍යුත් තැපෑලට යොමු කිරීම වහාම ක්‍රියාත්මක කළ යුතුය.

(ඉ) රාජ්‍ය ආයතන ආශ්‍රිතව සිදුවන සියලුම ආකාරයේ වංචා හා දූෂණ සම්පූර්ණයෙන් ම නවතාලන පරිදි ක්‍රමවේදයන්/යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීමේ වගකීම එක් එක් ආයතන ප්‍රධානියා විසින් පෞද්ගලිකව තම ඍජු අධීක්ෂණයට යටත් වන පරිදි වහාම ක්‍රියාත්මක කළ යුතුය. (සියලු මිලදී ගැනීම් සහ කොන්ත්‍රාත් ප්‍රදානයන් ආශ්‍රිතව තීරණ භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති මිලදී ගැනීම් මාර්ගෝපදේශ උපදෙස් ප්‍රකාරව එක් එක් අමාත්‍යාංශ/ආයතන/සංස්ථා/මණ්ඩල නිල වෙබ් අඩවි මගින් නිරන්තරව/අප්‍රමාදව මහජනතාව වෙත දැනුම්දීම 2012 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක කළ යුතු ව ඇත.)

(ඊ) මහජන පැමිණිලි/යෝජනා/අදහස් පිළිබඳ ව නිරන්තර අවධානය යොමු කරමින් වඩාත් මහජන හිතකාමී රාජ්‍ය සේවයක් සඳහා සාම්ප්‍රදායික පිළිතුරු සහන සැපයීමේ ක්‍රමවේද වෙනුවට වඩාත් කාර්යක්ෂමව සහ ප්‍රතිඵලදායක විසඳුම් ක්‍රම, එක් එක් රාජ්‍ය ආයතන විසින් කඩිනම් ක්‍රමවේදයන් ඔස්සේ හඳුනාගෙන, අදාළ නව සේවාවන් පිළිබඳ ව පුළුල් ප්‍රචාරයක් ලබා දීම. (2012 වර්ෂයේ මුල් කාර්තු දෙක තුළ සියලුම අමාත්‍යාංශ මේ සඳහා වූ ක්‍රමවේද හඳුනාගත යුතු ව ඇත. උදා: රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය භාවිතාව ප්‍රවර්ධනය, අන්තර්ජාලය ඔස්සේ විවිධ සේවාවන් ලබාදීම, සෞඛ්‍ය සේවාවන්ට අදාළ උපදෙස් හා සේවා සඳහා විශේෂිත දුරකථන සහ විද්‍යුත් තැපැල් ලිපිනයන් හඳුන්වාදීම, සාමාන්‍ය තැපැල් වෙනුවට විද්‍යුත් තැපැල් ක්‍රම හඳුන්වාදීම, සියලුම විභාගවල ප්‍රතිඵල අන්තර්ජාලය මගින් ප්‍රසිද්ධ කිරීම)

(උ) සීඝ්‍රයෙන් සංවර්ධනය වන රට තුළ ජීවත්වන ජනතාවගේ උසස් හා නව බලාපොරොත්තු ඉටු කරන රාජ්‍ය සේවයක් ලෙස සියලු රාජ්‍ය සේවාවන් යළි ප්‍රතිනිර්මාණය කර හඳුන්වාදීම සඳහා වූ විශේෂ ඒකකයක්, මාස හයක කාලයක් සඳහා එක් එක් අමාත්‍යාංශය විසින් පත්කර අදාළ ඒකකයේ කාලසීමාව දීර්ඝ කිරීමකට ලක් නොකර නියමිත කාලසීමාව තුළ නව සේවාවන් හඳුන්වා දී 2013 වර්ෂය ආරම්භයේ සිට එම සේවාවන් මහජනතාව වෙත හඳුන්වාදීම සඳහා වහාම කටයුතු කිරීම.

(ඌ) සෑම ලේකම්වරයෙක්ම තම අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආකාරයේ පර්යේෂණ අංශ වහාම ප්‍රතිසංවිධානයකට ලක් කර, වාර්ෂික නව හඳුන්වාදීම්වලට අදාළ ඉලක්ක සකස්කර, අදාළ ඉලක්ක සපුරාගැනීමට තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ද සහාය ඇතිව වැඩපිළිවෙලක් දියත් කිරීමට වහාම කටයුතු කිරීම.

ඉහත සියලු උපදෙස් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ පෞද්ගලිකව ම වගවීම තරයේ අපේක්ෂා කරන අතර සෑම කාර්තුවකම පැවැත්වෙන අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ කණ්ඩායම් රැස්වීම්වල න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඉහත සියලු ඉලක්ක සමාලෝචනයට ලක් කිරීමට නියමිත බව ද වැඩිදුරටත් දන්වමි.

ලලිත් වීරතුංග
ජනාධිපති ලේකම්

පිටපත්:
01. අමාත්‍ය මණ්ඩල ලේකම් } කා.දැ.ගැ.ස.
02. භාණ්ඩාගාර ලේකම් }
03. ලේකම්, රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය } අවශ්‍ය සම්බන්ධීකරණ සහායන් සඳහා
04. ලේකම්, ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය }
05. ලේකම්, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය }

M/Sec8